


# ස්වර මධුවන්ති සමඟින් අමරසිරි පීරිස්

සිසිර දිසානායක

"මිනිසා ..................
මරණ තුනක් ඇත - මිනිසා
බලා සිටී.........
නිරුවත් දෑසින් බලන්න
කන්‍යාවී...................

ස්වාභාව ධර්මයා විසින් විශ්වයට දායාද කළ විශිෂ්ඨතම දායාදය "මිනිසා" නොවේද? මනසින් උසස් වූ මිනිස් මනසින් බිහිවන දාර්ශනික සිතුවිලි මේ දියතේ අපූර්ව නිර්මාණ බිහි කිරීමෙහිලා පුරෝගාමී වී ඇති බව අවිවාදාත්මකයි. දාර්ශනික සිතුවිලි මත පිහිටා කෙරෙනා කලා නිර්මණෙ අතරින් ගියට ලැබෙනුයේ සුවිශේෂී වූ ස්ථානයකි. සිතුවිලිවලට මුහුවන මියැසියට මෙන්ම මිනිස් හැඩට ද දාර්ශනිකත්වය කැවී බිහි වූ අපූරු සිනමාරූපී ගීයක පද කිහිපයකි, අපගේ පූර්විකාවට මුල පිරූයේ.

වත්මන් හෙළ ගී කෙතේ දාර්ශනිකත්වයේ හඬ පෞර්ෂ්‍ය වන විශාරදද අමරසිර පීරිස් සංගීතවේදියාණන්ගේ අදහස් බෙදා හදා ගැනීමකටයි, මේ සූදානම. ජූනි මස පළමුවනදා පැවැත්වීමට නියමිත "ස්වර මධුවන්ති" ගී ප්‍රසංගයට සූදානම් වෙමින් සිටියදී ලද, මඳ ඉසිඹුවක් සිය රසික පාඨකයින් වෙනුවෙන් වැය කිරීමට කෘතවේදී විය, විශාරදවරයාණන්.

"මම ශාස්ත්‍රීය විදියට මුලින්ම සංගීතය ඉගෙන ගත්තේ රජයේ සංගීත විද්‍යාලයෙන්. දැන් සෞන්දර්ය විශ්වවිද්‍යාලය බවට පත් වෙලා තියෙන්නේ ඒ ආයතනයයි. එතනින් මම උත්තර භාරතීය රාගධාරී සංගීත අවුරුදු හයක පාඨමාලාවක් හැදෑරුවා. මූලිකව වයලීන වාදනයත් ඒ වගේම ගායනයත් පාඨමාලාවට ඇතුලත් වුණා" එයයි සංගීතවේදියාණන්ගේ අධ්‍යාපනයේ මුල්ම පියවර.

ඇත්තටම ඊට පස්සේ අපට ගුවන් විදුලි සංස්ථාවේ වාදක මණ්ඩලයට ඇතුලත් වෙන්න පුළුවන් වුණා. ඒ කාලේ නෙවිල් ජයවීර මහත්මයා තමයි ගුවන් විදුලියේ අධ්‍යක්ෂ ජනරාල් විදිහට හිටියේ. එතුමා ආරාධනයක් කරලා තිබුණා, රජයේ සංගීත විද්‍යාලයේන පිටවෙන අයව ගුවන් විදුලියේ සංගීත අංශයට ගන්න කියලා. ඒ දවස්වල විද්‍යාලයේ විදුහල්පති තුමා වෙලා හිටියෙ ආචාර්ය ලයනල් එදිරිසිංහ මහත්මයා, මාවත්, විජේරතන් රණතුංගවත්, වයි.එම් සුමනසේකරවත් ඉදිරිපත් කළා. අපේ ආයතනයෙන් දිවංගත තබ්ලා වාද්‍ය විශාරද විජේරත්න රණතුංගයන් සහ වයි. එම්. සුමනසිරි ප්‍රවීණ සිතාර් වාද්‍ය ශිල්පියාණන් පිළිබඳවයි, අමරසිරි පීරිස් ගේ ඒ මතක සටහන.

"ඉතින් පසුව පරීක්ෂණ වලින් සමත් වෙලා "ඒ" ශ්‍රේණියේ වයලීන වාදකයෙක් හැටියට පත්වීම ලැබුණා. ඉගෙන ගන්න කාලෙ ඉඳලමත් ආචාර්ය ප්‍රේමසිරි කේමදාසයන්ගේ ඇසුරක් මට තිබුණා. එතුමාගේ "සංගීත මංජරියේ" දී තමයි අපි මුණ ගැහුණෙ. ඉතින් එතුමා සංගීත අධ්‍යක්ෂණය කරපු මුද්‍රා නාට්‍ය, වේදිකා නාට්‍ය, කැන්ටාටා, ඔපෙරා වගේ සංගීත සංධ්වනි වලට වයලීනයෙන් දායක වෙන්න මටත් ඉඩ ලැබුණා. එතුමාගේ ස්වර ප්‍රස්ථාර හැම එකක්ම වාගේ ලියවුණේ මගේ අතින්."
එතුමාගෙන් තමයි මගේ එය වයලීන වාදන කටයුතු පටන් ගත්තේ, ඊට පස්සේ අමරදේව, ෂෙල්ටන් ප්‍රේමරත්න, ලයනල් අල්ගම වාගේ හැත්තෑව දශකයේ හිටපු දක්ෂම සංගීතඥයින්ගේ වැඩ කටයුතු වලටත් දායක වෙන්න අවස්ථාව ලැබුණා. ඒ කාලේ අඩු තාක්ෂණික පහසුකම් එක්ක නිදි මරාගෙන වැඩ කරපු හැටි මතක් වෙනවා"... ඔහු මුව'ගට සිනාවක් නැගෙයි.

"ඉතින් ඔය විදිහට අවුරුදු විස්සක් විතර මම කටයුතු කළා. ගුවන් විදුලියේ තිබුණ "ගීත තරංගනී", "ස්වර වරුණ", "රස බින්දු", "කල්පනා රේඛා" වාගේ වැඩසටහන් වලින් හොඳ නිර්මාණ බිහිවුණා. ඉතින් මගේ ගායන ජීවිතයට ප්‍රවේශය හැදුණොත් ඔය පසුබිම්මේදියි. ඇත්තටම ගයන්නට ඕන කියන හැඟීම මට තිබුණේ නෑ. මොකද වයලීනයට බොහොම ලැදියි මම. ඒත් ඔය කේමදාස මහත්තයාගේ "පහන් තරුව" කියන වැඩසටහනක වාදනයට ගිය වෙලාවේ එතුමා මට කිව්වා "මේ ගීතයක් තියෙනවා, කියමු" කියලා. ගීතය තමයි "ළඳුනේ" ගීතය. මම ඉතින් එක පාරින්ම ගීතය කිව්වා. පටිගත කිරීම් කරපු මර්වින් බෙන්ස් මහත්තයයි, කේමදාස මහත්තයයි දෙන්නම ඒ පළවෙනි හඬ කැවීමෙන්ම සෑහීමකට පත් වුණා. අමරසිරි පීරිස් ගායන ශිල්පියාගේ ඒ මුල්ම ගීය රචනා කරන ලද්දේ රන් බණ්ඩා සෙනෙවිරත්න ප්‍රවීණ ගී පද රචකයායි.

සිනමා පසුබිම් ගායනා පිළිබඳව සිහිපත් කිරීමේදී මුලටම සිහිවන ගීයකි "සිරි මැදුර" චිත්‍රපටයේ " කන්‍යාවී" ගීතය.
"ඔව්, ඊට කලින් මම "ගුරු ගෙදර" චිත්‍රපටියට යුග ගීතයක් ගායනා කළා, නිර්මලා රණතුංග සමඟ. ඒකටත් මට ජනාධිපති සම්මාන ලැබුණා. සමස්ථ චිත්‍රපට තේමාවම කියවෙන, පිටපතට බද්ධ වෙන ගීතයක් වුණා, "කන්‍යාවී" ගීතය." කේමදාසයන් විසින් සංගීතවත කළ ලූෂන් බුලත්සිංහල ලියූ මෙම ගීතය සම්පූර්ණයෙන්ම සිනමානුරූපී නිර්මාණයක් ලෙසින් අමරසිරි පීරිසුත් හඳුන්වයි.

"ගීතයේ වචනත්, තනුවත්, සංගීතයත් සියල්ල ගැඹුරුයි. අතුරු වාදන සංධ්වනි ස්වරූපයෙන් ඉදිරිපත් කෙරුණෙ. ඇත්තටම මම පින් කරලා තියෙනවා ඒ වගේ ගීතයක් ගයන්න."
එම ගැඹුරු නිර්මාණයට ගැඹුරු හඬක් එක් කරමින්, භාවයන් නැංවීමට හපන් වූ ගායන ශිල්පියෙකු හෙළ ගී කෙතට බිහි වීමත් පිනක් නොවේද?
"මගේ හඬ දියුණු කරගන්නේ නොයෙක් අභ්‍යාස කරලා. උත්තර භාරතීය සංගීත ගායනයට අමතරව මං විසින්ම නොයෙක් හැදෑරීම් කළා. මම කර්ණාටක් සංගීතය අහනවා. ඒ වගේම ජිම් රීව්ස් එන්ගල් බර්ඩ්, හරිබිලා" පන්ට්‍රි වාගේ බටහිර සංගීතවේදීන්ගේ ගායනා අහනවා. ඒ වගේම ඉන්දියාවේ භිම්නේ ජෝෂි, මුකර්නාත් ටාකූර්, ෆයිස් ඛාන් වගේ අයගේ ගායනාත් අහනවා. "වෙද හාමිනේ" ටෙලි නාට්‍ය කරන කාලයේ ලංකාවට ඇවිත් හිටියා කළු ඇමරිකන් ජාතික ගායන ශිල්පියෙක්, රොස්කෝ විලියම්ස් කියලා. ඔහු වසර තුනක් විතර ලංකාවේ හිටියා. මම ඔහුගෙනුත් බටහිර ගායනා ක්‍රම හැදෑරුවා. ඒ වගේම බටහිර ක්‍රමයට වයලීන් වාදනයන්, ඩග්ලස් ෆර්ඩිනන්ඩ්ස් මහත්මයාගෙන් ඉගෙන ගත්තා. දැන් මම වැඩියෙන් වාදනය කරන්නෙ "වියෝලා" කියන වයලීන පවුලේ වයලීනයට ටිකක් ලොකු භාණ්ඩය. ඒක ඔය "වෙද හාමිනේ" "අකාල සන්ධ්‍යා" වාගේ නාට්‍යවල අහන්නට ලැබෙනවා.

වයලීන් පවුලේ භාණ්ඩ, ප්‍රමාණයේ හැටියට වර්ග සතරකි. වයලීනය, වියෝලාව, චෙලෝව සහ ඩබල් බේස් ඒ භාණ්ඩයි. වයලීනය කුඩාම භාණ්ඩයයි. අමරසිරි පීරිස් ගායන ශිල්පියාගේ හඬ ආචාර්ය කේමදාසයන් විසින් අත් හදා බැලීම් ලෙස ද යොදා ගැණින. විශ්වයේ හොඳම සංගීත භාණ්ඩය පුහුණු කළ මිනිස් කටහඬ නෙවේද? ඒබ ව පසක් කර දුන් ගායනා අතර ටෙලිනාට්‍ය පසුබිම් ගායනා මුල්වෙයි. ඉහත කී ටෙලි නාට්‍ය වලට අමතරව "දඬුබස්නාමානය" ටෙලි නාට්‍යයේ ගායනා ද සිහිපත කළ හැකියි. කෙසේ වුවද, වර්තමාන පරපුරේ හද බැඳ ගැනීමට ඒ හඬ සමත් වූ සැටි නම් අපූරුයි.!

"දැන් ඔය ප්‍රවීණයන්ට චෝදනාවක් තියෙනවානේ අළුත් පරපුරට අත හිත දෙන්නේ නෑ කියන එක. ඉතින් අපිත් තේරුම් ගන්න ඕන ලෝකෙ හැම දෙයක්ම වෙනස් වෙනකොට ගීතයටත් වෙනසක් වෙන්න වෙනවා කියලා. බුදු දහමෙත් ඕක කියලා තියෙනවානේ. ඉතින් අපිත් ටිකක් වෙනස් වෙලා ඇර හානිය අවම කරගන්න උත්සහ කරන්න ඕන."

"හොඳම උදාහරණය තමයි "ඔබ ඇපල් මලක් වාගේ" ගීය. තාරුණ්‍යයට බොහොම ළංවුණ ගියක්. ඒ වුණාත් ප්‍රයෝගයක් විදියට ගීතයේ අගට "ඇලප්" කොටසක් එකතු කරගත්තේ මම, ඒ ගීතයේ ගායනයට ගැඹුරක් එකතු කරන්න." තනුව හදපු සංගීත් වික්‍රමසිංහ පවා කිව්වේ ඒ නිසා ගීතය අමුතුම ගීතයක් වුණා කියලා. " කන්‍යාවී" කැසට් පටියට කරපු සින්දු හැම එකක්ම වාගේ වෙනමම ආකෘතියකටයි කෙරුණෙ. ඉතින් තරුණ පිරිස් මේවා වැළඳ ගත්තා.

අමරසිරි පීරිස් සංගීතවේදියාණන්ග් හඬින් ගීතවත් වන "ස්වර මධුවන්ති" ප්‍රසංගය ජූනි පළමුවෙනිදා රිංග්වුඩ් හි ජෝර්ජ් වුඩ් පර්ෆෝර්මින් ආර්ට් සෙන්ටර් හිදී පැවැත්වීමට නියමිතයි. (Georgewood Performing Art Centre, Ringwood)

"ඇත්තෙන්ම මම හරි සන්තෝෂ වෙනවා, යම්කිසි ශාස්ත්‍රීය පදනමක ඉඳගෙන සංවිධානය කරන මේ වගේ ප්‍රසංගයකට සම්බන්ධ වෙන්න ලැබුණ එක ගැන. කෙනෙකුගේ අධ්‍යාත්මය අමතන ගීත ටිකක් ප්‍රසංගයක ගායනා කරන එක ලොකු පිනක්. ඉතින් ඒ පසුබිම මේ ප්‍රසංගය සංවිධානය කරන මනෝරිට තියෙනවා. ඇය ඉහළ මට්ටමක ශිල්පය හදාරලා තියෙනවා. ඇය, මා සමඟ ගායනයටත් එක්වෙනවා. මම ඇයට, ආශිර්වාද කරනවා. ඉතින් ඇයට වගේම ඇගේ සැමියා ජනක, සරත් බණ්ඩාර වගේ ඇයට සහය දෙන හැමෝටම ස්තුති වන්ත වෙනවා මේ කරන සද්කාර්යයට. ඒ වගේම මගේ රසික පිරිසටත් ඉතා ආදරයෙන් ආරාධනා කරනවා "ස්වර මධුවන්ති" බලන්න එන්න කියලා....."

අප සමඟ මෙල්බර්න්හි වෙසෙන ගායන නිපුන් මනෝරි විජයගුණවර්ධන සෞන්දර්ය විශ්වවිද්‍යාලයේ ලලිත කලාවේදී ශාස්ත්‍රපති උපාධිධාරිනියකි. භාරතයේ රතන් ජංකර් පඬිතුමාගෙන් ගායන ශෛලීන් ප්‍රගුණ කරමින් එහිදී නිපුන් උපාධිය ලබාගත් ඇය, ගායනාවන් සඳහා 1989-90 සමස්ථ ලංකා අන්තර් පාඨශාලා තරඟවලින් ප්‍රථම ස්ථානය, 1995 යෞවන සම්මාන උළලේ ප්‍රථම ස්ථානය, 200 ඕල් ඉන්දියා ශාස්ත්‍රීය ගායනා අංශයෙන් ප්‍රථම ස්ථානය, 1997-1998 ස්වර්ණවාහිණී "ස්වර්ණ වර්ණ ගී" ප්‍රථම ස්ථානය, ඇතුළු ජයග්‍රහණ රැසක් ලබා ඇත්තීය. ගුවන් විදුලි සරළ ගී ගායිකාවක ලෙසත්, වේදිකා නාට්‍ය රංගන ශිල්පිනියක ලෙසත් කටයුතු කළ ඇය සංගීතචාර්යවරියක ලෙස දක්ෂ සිසු පරපුරකට ද හිමිකම් කියන්නීය.

"1989 ගුවන් විදුලියට සරළ ගී ගායකාවක් විදියට සම්බන්ධ වෙන්න වුණු කාලයේ දීමයි මට අමරසිරි පීරිස් සංගීතවේදියාව හඳුනා ගන්න ලැබුනේ. වරක් "ප්‍රේම තටාකේ" ගීතයට යුග ගායනයෙන් මම අමරසිරි පීරිස් මහතාමයාට සහාය වුණා. ඉතින් එදා ඉඳන්ම මම ප්‍රිය කරපු ඒ හඬ මුහුවුණ ප්‍රසංගයක් කරන්න "ඕනකම මට තිබුණා. ඉතින් "ස්වර මධුවන්ති" ඒකේ ප්‍රතිඵලයක්. එට සවියක් වුණේ මගේ සැමියා, ජනක කුලරත්න මහත්මයා. ඒ වගේම සරත් බණ්ඩාර වාගේ විශාල පිරිසක් මාත් සමඟ ඉන්නවා.
ඇඩ්වාන්ස් කල්චරල් ඇන්ඩ් ස්පිරචුවල් සර්විසස් ඉදිරිපත් කරනා "ස්වර මධුවන්ති" ප්‍රසංගය සඳහා මව් බිමෙන් මෙහි පැමිණෙන වාද්‍ය ශිල්පීන් දෙපල වන්නේ නාලක අංජන කුමාර සහ පේෂල මනෝජ් ශිල්පීන්ය. සුභාවිත ගීතයේ තාරුණ්‍යය නියෝජනය වන ගී විශාල ප්‍රමාණයකට තනු හා සංගීත නිර්මාණයෙන් දායක වූ නාලක ප්‍රවීණ ගිටාර් වාද්‍ය ශිල්පියෙකු මෙන්ම සම්මානනීය සංගීත අධ්‍යක්ෂක වරයෙකු ද වෙයි. ගිටාර් පෙළක් පමණක් යොදාගෙන ඉදිරිපත් කළ "සුරම්‍ය රාත්‍රිය" රූපවාහිනී ප්‍රසංගයේ නියමුවා, ඔහුයි. භාරතීය වාද්‍ය නිපුන් පේෂල මනෝජ් ප්‍රාසාංගික කලාව පිළිබඳව ශාස්ත්‍රපති උපාධිධරයෙකි. තාල වාදනයෙන් "එරාජ්" සංගීත කණ්ඩායමට සහ වන ඔහු "දෙරන ලිට්ල් ස්ටාර්" විනිසුරුවරයෙකි. ප්‍රසංගයේ තබ්ලාව වාදනය වන්නේ පේෂල දෑතිනි.

ඕස්ට්‍රේලියාවෙන් අසංක ලියනගේ, සමිත ජයතිලක, ජූඩ් ප්‍රනාන්දු, රවි කුලතිලක හා චන්දිම ජයතිලක වාදනය සඳහා "ස්වර මධුවන්ති" සමඟින් එක්වෙති.

"අපි දන්නවා හොඳ රසික පිරිසක් මෙහි ඉන්න බව. ඇත්තටම මට ඒ වග පෞද්ගලිකව තේරුම් ගිහින් තියෙනවා. ඉතින් මම ඒ අය හැමෝටම ආරාධනය කරනවා මේ ප්‍රබුද්ධ ප්‍රේක්ෂකාගාරයට එකතු වෙන්න කියලා." ඒ ප්‍රසංගයේදී යුග ගායනයෙන් ද දායක වන මනෝරි විජය ගුණවර්ධනගෙන්, රසිකයන්ට කෙරෙන ඇරයුමයි.

